සුබස් සිතිවිලි

වික ධර්මබන්ධු

'යුද්ධ' යන සකු වචනය සිංහලට බිඳ ගෙන ඇත්තේ 'යුද' කියාය්. එහෙත් 'බුද්ධ' සහ 'ශුද්ධ' බිඳ ගෙන ඇත්තේ 'බුදු' සහ 'සුදු' කියාය්. 'පරිශුද්ධ' පිරිසුදු වී පසුව පරරූප (ආදේශ) විදියට - කියවීමේ පහසුව නිසා පිරිසිදු වී ඇත. දොඩන බසට එය පැමිණ ඇත්තේ 'සුද්ද' යනුවෙනි. සාමාන්‍ය මිනිසාට ශ/ෂ කියවෙන්නේ ශුඃ/ෂුඃ, ශඃ ෂඃ, ශා/ෂාඃ ,ශිඃ/ෂිඃ, ශෝක්/ෂෝක් වැනි තැන්වල දී ය. අද 'සුදු' බාවිතා වන්නේ 'ස්වේත' යන තේරුම දීම සඳහාය. 'ස්වේතඡත්‍ර' සේසත් වන අතර 'ස්වේත වර්න' සේවන් වේ. 'ස්වේත රශ්මි' සේරස් වේ. අද අපට 'සේ ' අමතක වී ඇත. 'සුද්දා' යන්නේ පිරිසිදු එකායන තේරුම ද ඇත.

මහා ප්‍රාණ නම් කියවෙන්නේ නැති තරම් ය. බුද්ද ප්‍රතිමාව, යුද්ද බූමිය, මුක පිලිකාව වැනි වචන කියවෙන්නේ නූගත්කම නිසා නො වේ. "සද්දෙ මොකෝ අව්රුද්ද ඇවිල්ලඃ ද..." , "පිලිකන්න පැත්තෙං සද්දක්/ සද්දයක් ඇහෙනවාඃ" වැනි තැන්වල 'ශබ්දය' කොතරම් පහසුවෙන් කියවේ දැය් සිතන්න. පන්සලේ "සද්ද පූජාව" ඔබට ඇසී ඇත.

පොදු ජනයා සාමාන්‍ය මිනිසා ජන වහර පොදු ජන, වහර ගැන ලියන කියන උගතුන් පොදුජනයාට 'අපබ්‍රංස' වැනි වූ න/ණ, ල/ළ, ශ/ෂ ත් , අල්ප ප්‍රානි/මහාප්‍රානත් මහත් බක්තියෙන් රැක ගෙන සිටීම පුදුමයක් නොවේද? ශුභ /සුභ අලුත් අව්රුද්ද, න/ණ, ල/ළ, භේදය, මූදේ ඝෝසාව, එලාඵල විස්තර ධන හානි එබඳු තැන් කීපයකි.

'හු' ප්‍රත්‍ය නාම පදයක අගට එකතු කොට බහු වචන උක්තයත් ඒක වචන අනුක්තයත් සාදා ගැනීමේ සිරිත වෙනස් වී ඇති හැටි පසුගිය ලිපි දෙකේ දක්වා ඇත.

"කිසි සිප් නොදත්තහු
දුරු රට සිට පැමිනියහු
ලෙස සිය පිය සුතහු
සොඳය් ඇති කල නිසා අප මොහු" යන ගීයේ නොදත්තහු පැමිනියහු, සුතහු (පුතහු) මොහු යනු 'නොදත්' , පැමිනි, සුත, මෙ" යන පදවල අනුක්ත රූපයය්. ඒ ගීය විරිත එලිවැට ගැන නොසිතා

"කිසි සිප් (නොදත්) නොදත්තකු වූත්
දුරු රට සිට (පැමිනි) පැමිනියකු වූත් මොහු
සිය පිය සුතකු (පුතකු) ලෙස
අප ඇති කල නියා (නම්) සොඳය්" යන විදියට ගැදි පැදියකින් වුවද ලිවිය හැකිය. අද අප අනුක්තය සඳහා 'හු' බාවිතා කරන්නේ (එ හු) ඔහු, (මෙ හු) මොහු වැනි තැන්වල පමනි. බුදුන් හා සබැඳි (ගන්ධ කුටිය) ගඳ කිලිය ගැන අසන කෙනෙකුට වැසිකිලිය මතක් වන්නේ එහි 'ගඳ' නිසාය. සු ගඳ ම 'සුවඳ' වී ඇතත් දු ගඳම 'දුවඳ' වී නැත. ඒ එසේ වූ පලියට යම් ලේඛකයකු තම ලේඛනයේ 'දුවඳ' යන්න ලිවුව හොත් අපට විරුදු විය නොහැක.

ඔහු හු = ඔවුහු, ඔව්හු යන්න කියවීමට අමාරු අව්‍යක්ත විදියට හදාගෙන ඇති වචනයක් නිසා කිසිවිටක මම 'ඔව්හු' නොලියමි.

'හේ' වෙනුවට මා 'ඔහු' ලියන්නේ නොලියාම බැරි නම් පමනි. අද බොහෝ දෙනා ලියන 'ඔහු හඬය්' යන වැකියත් ' අහා, ඔහු හඬන හැටි මම ඔහු හඬනු දිටිමි' යන වැකි දෙකත් නිවැරදි සේ පිලිගන්නා අපට 'ඔව්න්' මා දුටුහ මා ඔව්න් දුටුවෙමි, ඔව්න් අපි දුටහ අපි ඔවුන් දුටුමු' වැනි වැකි දකින විට ඉවසුම බුරුල් වන්නේ තද වන්නේ ඇය්? විසඳුම ඉතා සරලය. උවමනා වන්නේ,

අද වහරට අනුව ඔහු මා ඔව්න් අපි හෝ අප යන පද උක්තය සඳහාත් අනුක්තය සඳහාත් බාවිතා කිරීම සුදුසු බව පෙනේ' යනුවෙන් කිසියම් උගතකුගේ පොතක ලොකු අකුරින් ලිවීම පමනකි. පාසල්වල අව්රුදු තිස් පහක් (35) සිංහල උගන්වා ඇති මට තවමත් සමහර වියරණ රීති පැටලේ. නිදසුනක් වශයෙන් 'හාමුදුරුවෝ අද පන්සලේ නැත හාමුදුරුවන් තවමත් පන්සලට පැමින නැත' යන වැකි දෙක ගනිමි. හාමුදුරුවෝ/හාමුදුරුවන් වැරදි ලෙස ලියා පසුව නිවැරදි කළ අවස්ථා කිහිපයක් මට මතකය. මේ වැකි දෙකේ වරද නිවරද තේරුම් ගත නොහැකි අය සිටින බව මම දනිමි. එයට හේතුව මේ ලිපියේ අන් තැනක සඳහන් කර ඇත.

'මම' යන්න 'මා' වීමට කිසිදු වියරණ රීතියක් හරස් නොවේ. 'මම' යන්න ස්වර ලෝපයෙන් 'මම්' වේ. ව්‍යාංජන ලෝපයෙන් 'මා' වේ. (මි අ මි අ = ම මි අ ම අ = මා)
අට අසූ = අටාසු වන සැටිත් නව අනු = නවානු වන සතුටින් තේරුම් ගත්විට 'මම' යන්න 'මා' වන හැටි ද තේරුම් ගත හැකි ය.

'දිය ගොඩ හැම තැන කිරි ඉතිරේ' යන ගීය එක්තරා ගුරුවරයෙක් 'දියැ ගොඩැ හැම තැනැ කිරි ඉතිරේ' යන විදියට වෙනස් කොට ලමයන්ට ඉගැන්වීය. ලමයින් එය ගැයුවේ 'දියැ ගොඩැ හැමැ තැනැ කිරි ඉතිරේ' කියාය්. සන්දේශය චිත්‍රපටයේ (අද මේ වචනය 'චිත්‍ර තැටියේ' විය යුතු ද) 'එක් වැ සිටි සැවොමැ මතුරා විසඳ වැඩි උනා' යන ගීයේ 'සැවොමැ' යන්න යොදා ඇත්තේ 'හැම දෙනා මැ' යන තේරුම දීමටය්. 'හැම ' යන්න නිපාත පදයක් නිසා එය 'හැමා - හැමෝ - හැමා - හැමන් - හැමාට - හැමන්ට ' ආදී වශයෙන් වරනැගිය නො හැකිය. එහෙත් අද හැමෝ (ම) හැමෝ (ගෙම) හැමෝ (ටම) යන වියහරක් අසන්නට ලැබේ.

'සැවොමැ' යන්න ද එබඳු විකල වචනයක් බව පෙනේ. 'සැම (දෙනා) ම' යන පද තුන ම එකතු කොට හදා ගෙන ඇති 'හැමෝම' යන්නත් 'ඔවුහු' මෙන්ම නීතියක් රීතියක් නොතකා හදාගත් පිළි පැන ගිය පදයකි.

බාසාවක වචන සකස් වීමේදී බෙහෙවින් ම හේතු වන්නේ කියවීමේ පහසුවය්. සිංහල බාසාවේ එය විශේෂ ලක්ෂණයකි. සෙම්ප්‍රතිශ්‍යාව/හෙම්පිරිසාව/හෙම්බිරිසාව, රජ දරුවෝ/රජ්ජුරුවෝ, ස්වාමි (සාමි) දරුවෝ/හාමුදුරුවෝ, උන් වහන්සේ/උන්නාන්සේ, ක්ෂිතිජය/ සිතිජය වැනි වචන සකස් වී ඇති සැටි තේරුම් ගන්න. සාමි දරුවෝ - සාමු දරුවෝ - හාමුදුරුවෝ වීම සම්මත වියරනයට පටහැනිය. අ - උ - ඔ / ඇ - ඉ - එ වීම අනම්‍ය දේශයය්. 'උ' යන්න 'ඉ' යන්න වනු වෙනුවට මෙතන සිදු වී ඇත්තේ 'ඉ' යන්න 'උ' යන්න වීමය. එබඳු රීතියක් වියරන පොත්වල නැත. එකම රීතිය ස්වර සාමාන්‍යය්. 'දු' යන්නේ ඇති 'උ' ස්වරය නිසා 'මි' යන්නේ 'ඉ' යන්න 'උ' යන්න වී ඇත.

අපි උන් දැක්කඃ උනුත් අපි දැක්කඃ. මෙහි දෙවන වැකියේ 'අප' යොදා කියවීමට අමාරු නිසා එය 'අපි' වී නැතැය් සිතමි. 'උං අපට බැන්නා' යන තැන 'අපිට' වඩා 'අපට' පහසුවෙන් කියැවේ. අප ගෙන්/අපෙන්, අප ගේ/ අපේ වී ඇත්තේත් කියවීමේ අහසුව නිසා ය.

'මම' ට වඩා මම්/මා කියවීම පහසුය. ඌ/උන් අද 'බාල වචන' ලෙස සැලකේ. වහන්සේ සමග එකතු වී 'උන් වහන්සේ' (උන්නාන්සේ) හැදුනු විට ඒ බාලකම අහෝසි වේ. 'ඔහු' යන්න 'ඔව' වී හෝ 'උහ' යන්න 'උවු' වී අනතුරුව 'ඌ' හැදේ. (ගහයෝ නම් අඹර - දෙවියෝය ඌ සුරපුර) පැවති සම්මතය බිඳ දමා 'මා/ඔව්න්' ඇර ගෙන බස සරල කල නොහැක්කේ ඇය් ? සකු මගද බාසා ගුරු කොට ගන්නා අපට මගද බාසාවේ 'අහං - මයං - අම්හේ/ මම මය්හං - අමං - අම්හේ' යන විවිද රූප සිහියට නො ගැනේ.

ස්වරාන්ත පදවලට වඩා ව්‍යංජනාන්ත පද කියවීම පහසු ය. කරති/කරත්, මම/මම්, අපි/අපේ, බලහු/බලවු/බලව්, බලහි/බලයි/බලය් වන්නේ ඒ නිසා ය.

වචන මැදට වුව ද එය අමුතු නැත. බැලුම/බැල්ම, හසුන/හස්න, නැටුම/නැම්ම වේ. මුර්ධජ ණ/ළ දන්තජ න/ල බවට පෙරලා ගෙන හල් කර ගත් තැන් ලෙස (තළ) තැළුම/ තැල්ම, (පළ) පැළුම /පැල්ම දැක්විය හැක. ඇතුළු/ඇතුල්, තොරණැ/තොරන්, 'නැටුම' ම 'නැම්ම' වන නිසා (නැටුම්) නැමි යන වචනයත් 'බැඳුම' ම 'බැන්ම-බැම්ම වන නිසා (බැඳුම්) බැමි යන වචනයත් සදොස් බව මා සිසුනට කියා දී ඇති බව මට මතකය. එහෙත් ජනතාව අතරින් හැදුනු ඒ වචන මම අද පිළිගනිමි.

මේ ලිපියේ ඉතිරි කොටස් ලබන කලාපයේ.

මාධ්‍යවේදී ජගත් ජේ. එදිරිසිංහගේ පොත් එලිදැක්වීමේ උත්සවය වෙනුවෙන් මාධ්‍යවේදී ඇස්. පියසේන මහතා ශ්‍රී ලංකාවේ සිට.

ප්‍රවීණ ලේඛක, මාධ්‍යවේදී ජගත් ජේ. එදිරිසිංහගේ අලුත් පොත් කිහිපයක් එළිදකින මේ මොහොතේ නොවැළැක්විය හැකි කාරණාවක් නිසා මා හට සහභාගී වීමට නොහැකි වුවත් මෙවැනි සංදේශයක් ලියා එවීමට හැකිවීම භාග්‍යයක් කොට සලකමි.

ජගත් හා මා අතර තිබෙන මිත්‍රසමාගම දීර්ඝ කාලයක පටන් පැවත එන්නක්. මිත්‍රත්වයක් දිගු කලක් පවතින්නට හේතු කිහිපයක් තිබෙන්න පුළුවන්. ඒ වුණත් ප්‍රධාන හේතුවක් විදියට මා සලකන්නේ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික සංවේදීතාව අප දෙදෙනා තුළ අඩු වැඩි වශයෙන් සක්‍රියව තිබීමයි. අප අතර විශාල වයස් පරතරයක් තිබුණත් අප හුවමාරු කර ගන්නා, අප ගනුදෙනුවට යොදා ගන්නා ප්‍රශ්තුත සමකාලීන සුභාවිතයන්, සුභාෂිතයන්. එකිනෙකා අවබෝධ කරගැනීමත් මිත්‍ර සන්ධානය දුර දිග යෑමට තවත් හේතුවත්. ලංකාවෙන් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ බොහෝ පිරිසක් ඉන්නවා. ඉගෙනීම, ව්‍යාපාර පවත්වා ගැනීම රැකියාවක නියුක්ත වීම වැනි කාරනා ඉලක්ක කරගෙන වගේම දේශපාලන රැකවරණ පතාගෙන එන සරනාගතයනුත් ඒ අතර ඉන්නවා.එක් කෙනෙක් කාරණා කිහිපයක් සපුරා ගන්නවා වෙන්නත් පුළුවන්.

ජගත් ජේ. එදිරිසිංහ කියන චරිතයත් එහෙම චරිතයක්. ඔහු සංක්‍රමණය වන්නේ වැඩිදුර ඉගෙනීමට. නමුත් ඔහු ඊට පමණක් සීමා වන්නේ නැහැ. හුඟ දෙනෙකුට කරන්න බැරි විදිහේ දෙයක් ජගත්ට කරන්න පුළුවන් වන්නේ ජගත් කවියෙක්, ලේඛකයෙක්, කලාකරුවෙක්, මාධ්‍යවේදියෙක් වන නිසා. ඔහුට තිබුණු ලොකුම 'ඇම්මත්' ඒකයි. ඒ නිසා තමයි ඔහු 'පහන' 'සන්නස' පටන් ගන්නේ. 'සන්නස' පුවත්පතකට එහා ගිය මාධ්‍ය කවුළුවක්. ජගත්ගේ හපන්කම එය කොතරම් බාධක ආවත් අඩු පහසුකම් මැද වුණත් නොයෙක් අභියෝග මැද අඛණ්ඩව කරගෙන ඒමයි.

ඉගෙන ගැනීමෙන් වැඩ කිරීමත්, වැඩ කිරීමෙන් ඉගෙන ගැනීමත් ජගත්ගේ දර්ශනයේ න්‍යාය පත්‍රයේ අංගයක්. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඔහු තුළ ඇති දැනුම ඒ විෂයට අදාළ විභාග ආදිය ඉක්මවා යන්නක්.

ඒ නිසාමයි ඔහු සයිබර් අවකාශයට 'කවිය' මුදා හරින්නට පුරෝගාමී වන්නේ. ඔහු සෙසු කවියන්ට ඒ පැත්තෙන් සලසා ඇති පහසුකම ප්‍රශංසනීයයි. ඔහු ඒ පහසුකම සපයන්නේ නිර්ලෝභීව.

ජගත් සාහිත්‍යකරවෙක්, ලේඛකයෙක්. ඔහුගේ ආත්ම ප්‍රකාශනය කවියෙන් වුණත්, කෙටි කතාවෙන් වුණත්, නවකතාවෙන් වුණත්, චිතරක් නෙමෙයි චිත්‍රයෙන් වුණත් එළි දකිනවා. ඔහුගේ කෙටිකතාව තුළත් නව කතාව තුළත්, සිත්තම තුළත් කවියෙක් හුස්ම ගන්නවා. ඒක තමයි සුවිශේෂත්වය. ලේඛකයෙකුට සංක්‍රමණය වාසියට හරවා ගන්න පුළුවන් නම් ඒක ඉතා වැදගත්. එහෙම යොදා ගන්න නම් ඔහු යම්කිසි දැක්මකින් සන්නද්ධ විය යුතුයි. ඒ වගේම දෙරට පිළිබඳ 'ශබ්ද කෝෂ දැනුමට වඩා' එය දැනුමකින් සංජානනයකින් පෝෂණය වන්නෙකු විය යුතුයි. විශේෂයෙන් සාහිත්‍යය සම්බන්ධයෙන්.

ලංකාවේ ඕන තරම් පරිවර්තකයන් ඉන්නවා. ඔහු අතින් විදෙස් සාහිත්‍යකෘති බොහොමයක් පරිවර්තනය වෙනවා සිංහල භාෂාවට. ඒත් ඒවා හුදු පරිවර්තන මිසක් නිර්මාණ (ඔරිබ ජරද්එසදබ්) නෙමෙයි. පරිවර්තනයක් පරිනිර්මාණයකත් සෑහෙන වෙනස්කම් තිබෙනවා.

ජගත් පරිවර්තකයෙක්වත්, පරිනිර්මාණකරුවෙක්වත් නෙමෙයි. හෙලබසින් ම සාහිත්‍යාංග නිර්මාණයෙහි යෙදෙන ලේඛකයෙක්. ජගත් සංක්‍රමණය සාහිත්‍ය කෘති අරබයා වාසියට හරවා ගත්තාය කියන්නේ ප්‍රධාන හේතුවක් උඩ. ඒක මා දකින සුවිශේෂත්වයක්.
ඕනම රටක ජනසමාජයක පවතින සම්ප්‍රදාය යාවත්කාලීන වෙනවා. ඒක එහෙම වෙන්නත් ඕන. යාවත්කාලීන වන බව නොදැන කරන පරිවර්තනයෙන් පලක් නැහැ. ඒත් ජගත් ලියන නවකතාවක කවියක තමා ජීවත්වන ජනසමාජයේ, නව්‍යකරණය බොහොම අපූරුවට මූලික භාෂාවෙන් ම එනම් හෙළබසින් ම අඩංගු වෙනවා.
උදාහරණයක් විදියට ඔහුගේ 'ගිම්හාන සුළඟ' නව කතාව හඳුන්වා දෙන්න පුළුවනි. එහි ජීවත් වන චරිත සමකාලීනයි. එහි ඇති අවස්ථා සම්බන්ධය ඇතිවන පරිසරය, පසුබිම වෙනත් සාහිත්‍ය කරුවන් වෙනත් ඉංග්‍රීසි බසින් මවා ගන්නා හිතලු, ඇතැම්විට ප්‍රබන්ධ. අපේ ජගත් ඒවා ඇසුරු කරමිනුයි ලියන්නේ. ඒ නවකතාවේ ඇති පරිගණකයෙන් එකිනෙකා හමුවීම අද ලොව පුරා පැතිර ඇති ප්‍රවණතාවක්.

ඒ නවකතාවේ ඇති ගුවන් තොටුපළ ඔහු සියැසින් දුටු ඇසුරු කළ ඉසව්වක්. එහි නිරූපිත විශ්ව විද්‍යාල, බස්නැවතුම් පොළ ආදිය කියවන පාඨක අපගේ මනසේ අඳින සිත්තමට ඉටුකරන සාධාරණය ව්‍යාජ එකක් නෙමෙයි.

සමකාලීන සමාජයේ, එමෙත් නැත්නම් තමා ජීවත්වන සමාජයේ උපදින නොයෙකුත් අර්ථ සෞන්දර්ය සංසිද්ධීන් කෙරෙහි සංවේදීව කවි ලියන ඕස්ට්‍රේලියානුවන් දැකීම අසීරුයි. සමාජබද්ධ, සමාජය කෙරෙහිම ආසන්න ජගත් අපේ සමාජය දෙස බැලුම් හෙළන්නේ අපේ සමාජයෙන් මඳකට වෙන් වී ගිහින්. මම එහෙම කියන්නේ ඔහුගේ කවි පොත් දිහා බලලයි. ඔහු නිකම්ම සෞන්දර්ය වාදියෙක් නෙමෙයි, අර්ථසෞන්දර්යය වපුරන කෙනෙක්.

ඔහුට මා සුභ පතන්නේ හෘර්දයාංගමවයි.

ඇස්. පියසේන